Nestlé Good food, Good life

## මාධ්‍ය නිවේදනය

2020 දෙසැම්බර් 18, කොළඹදී...

# නෙස්ලේ දේශීය නවෝත්පාදන බලගන්වයි; හරිත වැඩසටහන් සහ දේශීය අමුද්‍රව්‍ය ඇසුරින් පෝෂණීය නිෂ්පාදන බිහිකිරීමට 200කට ආසන්න සරසවි සිසුන්ගේගේ නව අදහස් ලබාගනියි

දේශීය නවෝත්පාදන බලගැන්වීමේ අරමුණින් කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ සහ මොරටුව යන විශ්ව විද්‍යාල සමඟ නව සහයෝගීතාවකට එළඹෙමින් මෙරට සරසවි සිසුන්ට නව අභියෝගයක් ලබාදීමට නෙස්ලේ ලංකා සමාගම පසුගියදා පියවර ගත්තේය. දේශීය අමුද්‍රව්‍ය යොදාගනිමින් නිෂ්පාදනය කෙරෙන පෝෂණීය නිෂ්පාදන සහ විවිධ මුලපිරීම් තුළින් නෙස්ලේ සමාගමේ පාරිසරික තිරසාර බව වර්ධනය කිරීම වෙනුවෙන් නව අදහස් ජනනය කිරීම ඉන් අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහනට 200කට ආසන්න සරසවි සිසුන් ප්‍රමාණයක් තම අදහස් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ෆැබ්රිස් කැවාලින් මහතා ප්‍රකාශ කළේ, නෙස්ලේ සමාගම සෑමවිටම නවෝත්පාදන කෙරෙහි ප්‍රමුඛතාවක් ලබා දී ක්‍රියාකරන බව ය. " වර්තමාන පාරිභෝගික හැසිරීම් රටාවේ විශාල වෙනසක් අපට දකින්න ලැබෙනවා. එම නිසා අපේ බලාපොරොත්තුව, දේශීය නවෝත්පාදනය සඳහා සහාය වෙමින් අපගේ පාරිභෝගිකයින්ට ලබාදෙන නිෂ්පාදන වැඩිදියුණු කිරීමට එම නවෝත්පාදන යොදාගැනීම යි. ඒ වගේම තිරසාරභාවය හා පෝෂණ ගුණය සහතික කළ නිෂ්පාදන පිරිනැමීමට අපි ප්‍රමුඛතාව ලබාදෙනවා. අපට අවශ්‍ය පාරිභෝගිකයින්ට වගේම පරිසරයටත් හිතකර නිෂ්පාදන පිළිගැන්වීමයි", ඔහු වැඩිදුරටත් පැවසීය.

මෙම අභියෝගතා වැඩසටහන හරහා සමාගමට තම නවෝත්පාදන ක්‍රියාවලිය අලුත් කරගැනීමට මෙන්ම දේශීය දැනුම උපයෝගී කරගැන්මට ද අවස්ථාවක් හිමිවන අතර, තරුණ පරම්පරාව අතර නව්‍යකරණ චින්තනය දිරිමත් කිරීම ද නෙස්ලේ අභිලාෂය වී තිබේ. ඒ අනුව වැඩසටහනට ඇතුළු වන සියලු සරසවි සිසුන්ට තම තමන්ගේ නවෝත්පාදන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මඟපෙන්වීමක් මෙන්ම, වටිනා අදහසක් සංකල්පගත කරන්නේ කෙසේද යන්න පිළිබඳව ද දැනුම හිමිවනු ඇත.